# රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
# பதிவாளர் நாயகம் திணைக்களம்
# REGISTRAR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } RG/NB/01/චක්‍රලේඛ

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
HEAD OFFICE

තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No. } 565

ඔබේ අංකය / உமது இல. / Your No. }

234/A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
234/A3, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
234/A3, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

දිනය / திகதி / Date } 2022.10.21


චක්‍රලේඛ අංක : 15/2022

සියළුම කලාප භාර නියෝජ්‍ය/සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් සහ
සියළුම ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් වෙත,

<u>දෙවන පිටපත් නියමිත දිනට බාර නොදෙන නොතාරිස්වරුන් සම්බන්ධයෙන් කටයුතු කිරීම</u>

උක්ත කරුණට අදාළව මා විසින් මීට පෙර නිකුත් කරන ලද අංක RG/NB/01/චක්‍රලේඛ සහ 2021.03.03 හා 2022.02.08 දිනැති ලිපි මෙයින් අවලංගු කරමි. ඒ අනුව 2022.12.01 දින සිට මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන බලපැවැත්වෙන බව දන්වා සිටිමි.

02. 107 අධිකාරය වන නොතාරිස් ආඥා පනතේ 31 (26) වගන්තිය ප්‍රකාරව සෑම නොතාරිස්වරයෙකු විසින්ම කිසියම් මාසයක් තුළ ඔහු විසින් ලියා සහතික කරන ලද සෑම නීත්‍යානුකූල ලේඛනයකම දෙවන පිටපත් එම ලේඛනවල නාමාවලියක් සමඟ හෝ ලේඛන ලියා සහතික කර නොමැති නම් හිස් ලැයිස්තුවක් ඊළඟ මාසයේ 15 වෙනි දින හෝ එදිනට ප්‍රථම තමා පදිංචි දිස්ත්‍රික්කයේ ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත බාර දිය යුතුය.

03. ඇතැම් නොතාරිස්වරුන් තමා ලියා සහතික කරනු ලබන ලේඛනවල දෙවන පිටපත්, අදාළ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලය වෙත නියමිත දිනට බාර නොදෙන බවට මා වෙත ලැබෙන මහජන පැමිණිලිවලින් අනාවරණය වේ. මේ හේතුවෙන් ලේඛන සංරක්ෂණය හා සහතික පිටපත් නිකුත් කිරීම ගැටළු සහගත වන අතර විගණන විමසුම්වලට පිළිතුරු සැපයීමට ද මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට සිදුවී ඇත.

ඉහත තත්ත්වය අවම කර ගැනීම සඳහා පහත ක්‍රියාමාර්ග අනුගමනය කරන ලෙස දන්වා සිටිමි.

I. දෙවන පිටපත්, පුරුද්දක් වශයෙන් නියමිත දිනට බාර නොදෙන නොතාරිස්වරුන්ගේ නාම ලේඛනයක් මහජනතාවට පහසුවෙන් බලාගත හැකි පරිදි ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාල පරිශ්‍රය තුළ ප්‍රදර්ශනය කිරීම.

II. දෙවන පිටපත් නියමිත දිනට බාර නොදීම සම්බන්ධව යම් නොතාරිස්වරයෙකුට සමථ මුදලක් නියම කරන්නේ නම් එය දින 30 ක් තුළ ගෙවා නිම කළ යුතු බවට නොතාරිස්වරයා වෙත දැනුම් දීම.

III. සමථ මුදල් ගෙවීම දිගින් දිගටම පැහැර හරින නොතාරිස්වරුන් වෙත තවදුරටත් සමථ මුදල් පැනවීම නොකළ යුතු වීම.

IV. දෙවන පිටපත් ප්‍රමාද වී බාර දීම සම්බන්ධයෙන් යම් සමථ මුදලක් පනවා එය ගෙවන ලෙස අදාළ නොතාරිස්වරයා දැනුවත් කර මසක් තුළදී සතුටුදායක නිරාකරණයක් නොලදහොත් අදාළ සමථය සම්බන්ධයෙන් නොතාරිස්වරයා එකඟ නොවූ බවට සලකා ඉඩම් රෙජිස්ට්‍රාර් විසින් කලාප භාර නියෝජ්‍ය/සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත වාර්තා කර නඩු පැවරීමට නිර්දේශ කළ යුතුය. එවැනි අවස්ථාවලදී කලාප භාර නියෝජ්‍ය/ සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් එම නොතාරිස්වරයාට විරුද්ධව නඩු පැවරීමට අනුමැතිය ලබා දිය යුතු වීම.

(පැමිණිල්ලේ ආකෘතියක් ඇමුණුම 01 මගින් දක්වා ඇත.)

V. දෙවන පිටපත් ප්‍රමාද වී බාරදීම සම්බන්ධව නඩු පැවරීම සඳහා අනුමැතිය ලබා දීමට පෙර නොතාරිස් ආඥා පනතේ 34(1) වගන්තියට අනුව රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ඒ කාර්යය සඳහා නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි වැඩිදුරටත් වූ කාලයක් ඇතුළත එකී නියමයන්ට අනුව ක්‍රියා කරන ලෙස අදාළ නොතාරිස්වරයා වෙත ලියාපදිංචි තැපැලෙන් ලිඛිත දැන්වීමක් සිදු කළ යුතුය. (අදාළ සමථය ගෙවා නොමැති බවත් දින 14ක කාලයක් තුළ නොගෙවන්නේ නම් නඩු පැවරීමට කටයුතු කරන බවට නොතාරිස්වරයා වෙත දැනුම් දීම) (ඇමුණුම 02)

VI. දෙවන පිටපත් නියමිත දිනට බාර නොදීම සම්බන්ධව නඩු පවරන අවස්ථාවේදී අදාළ නොතාරිස්වරයාට ඒ වනවිට නියම කර ඇති සියලුම සමථ මුදල් අහෝසි වේ.

VII. නඩු පවරන අවස්ථාවේදී නොතාරිස්වරයාගේ සමථ මුදල් ශේෂය සහ නඩු පැවරීමත් සමගම එම ශේෂය අහෝසි වන බව ප්‍රධාන ගණකාධිකාරී වෙත දැනුම් දීම.

ඔබ විසින් දැනටමත් මාසිකව ගිණුම් අංශය වෙත යොමු කරන සමථ මුදල් වාර්තාව වෙනුවට මින් ඉදිරියට මෙහි ඇමුණුම 03 මඟින් දක්වා ඇති සංශෝධිත ආකෘතියට අනුව සකස් කරන ලද එක් එක් මාසය සඳහා වන සමථ මුදල් වාර්තාවක්, ඊළඟ මස 15 වන දින හෝ ඊට පෙර නොතාරිස් අංශයට ද පිටපතක් සහිතව ගිණුම් අංශය වෙත යොමු කිරීම.

VIII. නඩුව පවත්වාගෙන යන අතරතුර නඩුව සමථයකට පත් කර ගන්නා ලෙස අධිකරණය යෝජනා කරන්නේ නම් නොතාරිස්වරයා විසින් ගෙවිය යුතු සම්පූර්ණ සමථ මුදල සහ පරිපාලන වියදම් වශයෙන් එකී සම්පූර්ණ සමථ මුදලින් 25% ක මුදලක් ද අය කර ගෙන නඩු කටයුතු අවසන් කිරීම.

IX. නඩු කටයුතු අවසන් වූ පසුව ද දෙවන පිටපත් නියමිත දිනට බාරදීම සිදු නොකරන්නේ නම් අදාළ නොතාරිස්වරයාගේ නම වාර්ෂික මහාධිකරණ සහතිකය ලබා දීම සඳහා නිර්දේශ නොකරන බව නියමිත මහාධිකරණය වෙත දැනුම් දීම.

04. නොතාරිස්වරුන්ගෙන් අය විය යුතු විශාල සමථ මුදල් ප්‍රමාණයක් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලවල පවතින බැවින් ඒ සම්බන්ධව ඉදිරි පියවර නොගැනීම, විගණන විමසුම්වලට හේතු වී තිබේ. සමථ මුදල් නිරාකරණය කර ගැනීම සම්බන්ධව වගකීමෙන් යුතුව තම කාර්යය ඉටුකරන ලෙස අවධාරණය කරන අතර ඔප්පු ලියාපදිංචි කිරීම පිළිබඳ දෙපාර්තමේන්තු නියෝග 375 කෙරෙහි ද ඔබගේ අවධානය යොමු කරවමි.

පී.එස්.පී. අබේවර්ධන

රෙජිස්ට්‍රාර් ජනරාල්

පිටපත් : 01. අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල් -
02. ප්‍රධාන ගණකාධිකාරී -
03. ප්‍රධාන අභ්‍යන්තර විගණක -
04. සියලුම දිස්ත්‍රික් භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් -
05. විගණකාධිපති -

(01–05) කාරුණික දැන ගැනීම සඳහා

(ඇමුණුම 01)

......................................................... මහේස්ත්‍රාත් උසාවියේ දී ය.

20....................................... මස .................................. වැනි දින දී ය.

මෙම උසාවියේ අධිකරණ සීමාව ඇතුළත පිහිටි .................................... දිස්ත්‍රික්කයේ ............................................... නොතාරිස් වෘත්තියේ කටයුතු කිරීමට බලයලත් ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වන..................................................................................................,

1. 20.......................... මාසය තුළ තමා ඉදිරිපිට දී ලියා අත්සන් කරන ලද්දා වූ නොහොත් නීත්‍යානුකූල ලේඛනවල *දෙවෙනි පිටපත් හා ඒවායේ සවිස්තරාත්මක මාසික වාර්තා පිටපත්* දෙකකින් යුක්ත වූ ලැයිස්තුවක් (107 වැනි අධිකාරය වන) නොතාරිස් ආඥා පනතේ 31 වැනි වගන්තියේ 26 (අ) වැනි ව්‍යවස්ථාවෙන් නියමිත කාල පරිච්ඡේදය ඇතුළත දී එකී ව්‍යවස්ථාවෙන් නියම කර ඇති ආකාරයට................................................ ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත භාර දීම නොහොත් යැවීම පැහැර හැරීමෙන් එකී ව්‍යවස්ථාව උල්ලංඝනය කර තිබෙන බව හා එසේ උල්ලංඝනය කිරීමෙන් ඔහු (107 වන අධිකාරය වන) නොතාරිස් ආඥා පනතේ 34 (1) වැනි වගන්තිය යටතේ දඩුවම් ලැබිය යුතු වරදක් කර තිබෙන බවත්,

2. එකී 20...................... මාසය තුළ තමා ඉදිරිපිටදී ලියා අත්සන් කරන ලද්දා වූ නොහොත් පිළිගන්නා ලද්දා වූ හෝ තමා විසින් සාක්ෂි දරන ලද්දා වූ ඔප්පු හෝ නීත්‍යානුකූල ලේඛන කිසිවක් නොවී නම්, ඒ පිළිබඳ "හිස් ලැයිස්තුවක්" (107 වන අධිකාරය වන) නොතාරිස් ආඥා පනතේ 31 වැනි වගන්තියේ 26 (අ) වැනි ව්‍යවස්ථාවෙන් නියමිත කාල පරිච්ඡේදය ඇතුළත දී එකී ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කිරීම පැහැර හැරීමෙන් ඔහු එකී ව්‍යවස්ථාව උල්ලංඝනය කර තිබෙන බව හා එසේ උල්ලංඝනය කිරීමෙන් ඔහු (107 අධිකාරය වන) නොතාරිස් ආඥා පනතේ 34 (1) වැනි වගන්තිය යටතේ දඩුවම් ලැබිය යුතු වරදක් කර තිබෙන බවත්,

3. 20..................... මාසය තුළ තමා ඉදිරිපිට දී ලියා අත්සන් කරන ලද්දා වූ නොහොත් පිළිගන්නා ලද්දා වූ හෝ තමා විසින් සාක්ෂි දරන ලද්දා වූ හෝ සියළුම ඔප්පුවල නොහොත් නීත්‍යානුකූල ලේඛනවල *දෙවෙනි පිටපත් හා ඒවායේ සවිස්තරාත්මක මාසික වාර්තා පිටපත්* දෙකකින් යුක්ත වූ ලැයිස්තුවක් හෝ එකී 20......................... මාසය තුළ තමා ඉදිරිපිට දී ලියා අත්සන් කරන ලද්දා වූ නොහොත් පිළිගන්නා ලද්දා වූ හෝ තමා විසින් සාක්ෂි දරන ලද්දා වූ ඔප්පු හෝ නීත්‍යානුකූල ලේඛන කිසිවක් නොවේ නම් ඒ පිළිබඳව හිස් වාර්තාවක් හෝ නොතාරිස් ආඥා පනතේ 31 වැනි වගන්තිය (26) වැනි ව්‍යවස්ථාවෙන් නියමිත කාල පරිච්ඡේදය ඇතුළත දී.......................................... ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත භාර නොදීම නොහොත්

නොයැවීම සම්බන්ධයෙන් තම නිදහසට කරුණු ඉදිරිපත් කරන ලෙස රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ නියෝගය යටතේ................................................ ඉඩම් රෙජිස්ට්‍රාර් විසින් 20.................... වැනි දින එකී නොතාරිස්ට නියම කරන ලද නමුත්, එම නියමය පරිදි නිදහසට කරුණු ඉදිරිපත් කිරීම පැහැර හැරීමෙන් ඔහු (107 අධිකාරය වන) නොතාරිස් ආඥා පනතේ 31 වැනි වගන්තියේ 34 ව්‍යවස්ථාව උල්ලංඝනය කර තිබෙන බව හා එසේ උල්ලංඝනය කිරීමෙන් (107 අධිකාරය වන) නොතාරිස් ආඥා පනතේ 34(1) වගන්තිය යටතේ දඩුවම් ලැබිය යුතු වරදක් කර තිබෙන බවත්, ........................................ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලිපිකරු, අතිරේක ඉඩම් රෙජිස්ට්‍රාර් තැන්පත් ........................................... වන මම 1979 අංක 15 දරණ අපරාධ නඩු විධිවිධාන සංග්‍රහය පනතේ 136(1) (අ) වගන්තිය අනුව උසාවිය වෙත මෙයින් වාර්තා කර සිටිමි.

පැමිණිලිකරු

නොතාරිස්ට නියම කරන ලද නමුත්, එම නියමය පරිදි නිදහසට කරුණු ඉදිරිපත් කිරීම පැහැර හැරීමෙන් ඔහු (107 වැනි අධිකාරය වන) නොතාරිස් ආඥා පනතේ 31 වැනි වගන්තියේ 34 වැනි ව්‍යවස්ථාව උල්ලංඝනය කර තිබෙන බව හා එසේ උල්ලංඝනය කිරීමෙන් (107 අධිකාරය වන) නොතාරිස් ආඥා පනතේ 34(1) වැනි වගන්තිය යටතේ දඩුවම් ලැබිය යුතු වරදක් කර තිබෙන බවත්,

.......................................ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලිපිකරු, අතිරේක ඉඩම් රෙජිස්ට්‍රාර් තැන්පත් ....................................... වන මම 1979 අංක 15 දරණ අපරාධ නඩු විධිවිධාන සංග්‍රහය පනතේ 136(1) (අ) වගන්තිය අනුව උසාවිය වෙත මෙයින් වාර්තා කර සිටිමි.

පැමිණිලිකරු

<u>සාක්ෂි වශයෙන් ඉදිරිපත් කිරීමට අදහස් කරන ලිපිලේඛන</u>

01. ..................................... ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයට ලැබෙන දෙවැනි පිටපත් පිළිබඳ රෙජිස්ටරය.

02. ඉඩම් රෙජිස්ට්‍රාර් විසින් චූදිතයාගෙන් නිදහසට කරුණු අසා ඔහුට පළමුව යවන ලද ................................ දින දරණ ලිපියේ සහතික කළ පිටපත.

03. ඉඩම් රෙජිස්ට්‍රාර් විසින් චූදිතයාගෙන් නිදහසට කරුණු අසා ඔහුට පළමුව යවන ලද ................................ දින දරණ ලිපියට අවධානය යොමු කොට යවන ලද..................................... දින දරණ ලිපියේ සහතික කළ පිටපත.

(ඇමුණුම 02)

ලියාපදිංචි තැපැල

මගේ අංකය : ...................................
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව ,
........................ කලාප කාර්යාලය
......................................................
......................................................

20.........

මහත්මියණි/මහත්මයාණනි,

<u>වර්ෂ 20..... ................... තුළ ලියා සහතික කරන ලද දෙවන පිටපත්.</u>

ඔබ විසින් 20... ........................ මාසය තුළ දී ලියා සහතික කරන ලද ඔප්පුවල දෙවන පිටපත් / හිස් ලැයිස්තු .............. ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත යැවීම ප්‍රමාද කර ඇති බැවින් (107 වැනි අධිකාරය වන) නොතාරිස් ආඥා පනතේ 31 (26) වගන්තියේ නියමයන් උල්ලංඝනය කර ඇති බව දන්වමි.

02. එකී වරද සමථයකට පත්කර ගැනීම සඳහා නොතාරිස් ආඥා පනතේ 35(1) වගන්තිය අනුව ඔබ වෙත රු........................ක සමථ මුදලක් පනවා ඇතත් ඔබ විසින් එය ගෙවීමද මේ දක්වා පැහැර හැර ඇත.

03. එකී සමථය සම්බන්ධයෙන් එකඟතාවයකට පත්වන්නේ නම් මෙදින සිට දින 14ක් තුළදී .................. ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත ඉහත කී සමථ මුදල ගෙවීමට කටයුතු කරන ලෙස දන්වන අතර එසේ නොවුනහොත් ඔබ එම සමථයට එකඟ නොවූ ලෙස සලකා ඒ සම්බන්ධයෙන් නොතාරිස් ආඥා පනතේ 34 වන වගන්තිය අනුව නඩු පැවරීමට කටයුතු කරන බව මෙයින් දන්වමි

මෙයට ,
විශ්වාසී ,

රෙජිස්ට්‍රාර් ජනරාල්

....................................... මයා/මිය ,

..................... ,

..................... ,

..................... .

පිටපත :

01 ඉඩම් රෙජිස්ට්‍රාර්/ ......................... - දින 14 ඉක්මවූ පසු සමථ මුදල් ගෙවා නොමැති නම් මා වෙත වාර්තා කිරීම සඳහා

(ඇමුණුම 03)

## දෙපාර්තමේන්තුවේ සමථ මුදල් පිළිබඳ වාර්තාව - ................ වර්ෂය

...................................... ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලය ................... මාසය .............

| අනු අංකය | නොතාරිස්ගේ නම | ආරම්භක සමථ මුදල් ශේෂය [පෙර මාසයේ ..... දිනට (අවසන් දිනය) ඉතිරි මුදල] | සමථ මුදල් | | | | | | | මෙම මාසයේ ......... දිනට (අවසන් දිනය) ඉතිරි මුදල | විශේෂ තොරතුරු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | අදාළ මාසය තුළ පනවන ලද සමථ මුදල් | | අය කරන ලද සමථ මුදල් | | | අධිකරණයේ නඩු පැවරීම මත අහෝසි වන සමථ මුදල් | | | |
| | | | පනවන ලද දිනය | පනවන ලද මුදල | අය කළ දිනය | පනවන ලද දිනය | අය කළ මුදල | නඩු පවරන ලද දිනය | අහෝසි වූ සමථ මුදල් ශේෂය | | |
| | | *(ශේෂය)* | | | | | | | | | |
| 1. | | | | | | | | | | | |
| 2. | | | | | | | | | | | |
| 3. | | | | | | | | | | | |
| 4. | | | | | | | | | | | |
| 5. | | | | | | | | | | | |
| 6. | | | | | | | | | | | |
| 7. | | | | | | | | | | | |
| 8. | | | | | | | | | | | |
| 9. | | | | | | | | | | | |
| | එකතුව | | | | | | | | | | |

පිළියෙළ කළේ :

පරීක්ෂා කළේ :

...........................................................................

ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්